මගේ අංකය :- 01/05/5-5

2001

නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය,
බදුළුඔය/ බත්මැඩිල්ල ව්‍යාපාරය,
කන්දකැටිය.
2019/04/02

ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ
සියළුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

07 MAY 2019
AP
වාරිමාර්ග කළමනාකරණ

**<u>විශේෂ ව්‍යාපාර කළමනාකරණ කමිටුව - 2019/04/02</u>**

බදුළුඔය/ බත්මැඩිල්ල ව්‍යාපාරයේ විශේෂ ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම 2019/04/02 වන දින පෙ.ව.9.30ට කන්දකැටිය වාරිමාර්ග ශ්‍රවණාගාරයේ දී පැවැත්විය.

**සහභාගී වූ රජයේ නිළධාරීන්**

| | නම | තනතුර සහ ආයතනය |
|---|---|---|
| 01 | එස්.එච්.එල්.දයාපාල මයා | නේවාසික ව්‍යාපාර කළමණාකරු, බදුළුඔය/බත්මැඩිල්ල ව්‍යාපාරය |
| 02 | එස්.ඩී.මොලගොඩ මයා | වාරිමාර්ග ඉංජිනේරු, වාරිමාර්ග කාර්යාලය |
| 03 | කේ.ජී.එන්.මධුරංග මයා | ගොවිජන සංවර්ධන නිළධාරි, ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 04 | ආර්.එම්.සී.පී.රත්නායක මයා | ඉංජිනේරු සහකාර, බදුළුඔය ව්‍යාපාරය |
| 05 | ඩබ්.එම්.ආර්.ජී.වීරසූරිය මයා | ඉංජිනේරු සහකාර, බත්මැඩිල්ල ව්‍යාපාරය |
| 06 | ඩී.වී.එල්.එම්.දහනායක මයා | තාක්ෂණික සහයක (අ/ප) |
| 07 | ජී.ඩබ්.එස්.එස්.කේ.කුලතිලක මිය | කළමනාකරණ සහකාර, බදුළුඔය/බත්මැඩිල්ල ව්‍යාපාරය |
| 08 | ආර්.එම්.ප්‍රශාන්ත කුමාර මයා | තාක්ෂණික සහයක, වාරිමාර්ග කාර්යාලය |
| 09 | ආර්.එම්.පී.මධුසංඛ මයා | තාක්ෂණික සහයක, බදුළුඔය |
| 10 | ආර්.එම්.සුදුමැණිකේ මිය | කෘ.ප.නි.ස, කන්දකැපුළුල්පත |
| 11 | ඩී.එම්.කරුණාවතී මිය | කෘ.ප.නි.ස, බදුළුඔය/ බටහිර |
| 12 | ඩී.එම්.ධර්මදාස මයා | කෘ.ප.නි.ස, බදුළුඔය/ බටහිර |
| 13 | ආර්.එම්.ජානක මයා | තාක්ෂණික සහයක, බත්මැඩිල්ල ව්‍යාපාරය |
| 14 | ආර්.එම්.සිදේවි සෝමලතා මිය | කෘ.ප.නි.ස, කිරිවෙහෙර/ මූඩගමුව |

**සහභාගී වූ ගොවි සංවිධාන නිළධාරීන්**

| | නම | තනතුර සහ ගොවි සංවිධානය |
|---|---|---|
| 01 | බී.ජනනාථ සිරිවර්ධන මයා | ගරු ලේකම්,වීරඋදාර ගොවි සංවිධානය |
| 02 | ආර්.එම්.තිලකරත්න මයා | ගරු සභාපති,වීර උදාර ගොවි සංවිධානය |
| 03 | ආර්.එම්.රත්නායක මයා | සාමාජික |
| 04 | ආර්.එම්.ජයසුන්දර මයා | ගරු සභාපති,වීර කැප්පෙටිපොල ගොවි සංවිධානය |
| 05 | ආර්.එම්.සෝමපාල මයා | ගරු ලේකම්,සමගි ගොවි සංවිධානය |
| 06 | ඩී.ජී.මුණසිංහ මයා | ගරු භාණ්ඩාගාරික,දිලෙනතරු ගොවි සංවිධානය |
| 07 | ඩී.එම්.නන්දන පියතිස්ස මයා | ගරු ලේකම්,එක්සත් ගොවි සංවිධානය |
| 08 | ඩබ්.එම්.කරුණාතිලක මයා | ගරු සභාපති,එක්සත් ගොවි සංවිධානය |
| 09 | ජේ.එම්.වීරකෝන් මයා | ගරු ලේකම්,වීර කැප්පෙටිපොල ගොවි සංවිධානය |
| 10 | එස්.එම්.රණසිංහ මයා | ගරු ලේකම්,දිලෙනතරු ගොවි සංවිධානය |
| 11 | ජී.ජේ.එම්.වීරතුංග මයා | ගරු ලේකම්,පැරකුම් ගොවි සංවිධානය |
| 12 | ආර්.එම්.උඩේසේකර මයා | ගරු සභාපති,පැරකුම් ගොවි සංවිධානය |
| 13 | ඩී.එම්.ජයසුන්දර මයා | ගරු සභාපති,ගැමුණු ගොවි සංවිධානය |
| 14 | ආර්.එම්.ලොකුබංඩා මයා | ගරු ලේකම්,ගැමුණු ගොවි සංවිධානය |

| | | |
|---|---|---|
| 15 | එස්.බී.දිසානායක මයා | සාමාජික |
| 16 | ජී.එම්.සූරසේන මයා | ගරු භාණ්ඩාගාරික,ගැමුණු ගොවි සංවිධානය |
| 17 | එම්.වීරසිංහ මයා | ගරු ලේකම්,වීර පැරකුම් ගොවි සංවිධානය |
| 18 | ජේ.එස්.එම්.දිනදාස මයා | ගරු භාණ්ඩාගාරික, වීර පැරකුම් ගොවි සංවිධානය |
| 19 | ආර්.එම්.වීරසිංහ මයා | ගරු භාණ්ඩාගාරික,සුචරිත ගොවි සංවිධානය |
| 20 | ඩී.එම්.නන්දසේන මයා | සාමාජික, කහගොල්අරාව |
| 21 | එස්.එම්.රත්නපාල මයා | සාමාජික, මහකැලේ |
| 22 | සෙනෙවිරත්න මයා | සාමාජික, මහකැලේ |
| 23 | ඩී.එම්.එම්.පී.දිසානායක මයා | ගරු සභාපති,පුබුදු ගොවි සංවිධානය |
| 24 | ඩබ්.එම්.ජයසුන්දර මයා | ගරු සභාපති, ගජබා ගොවි සංවිධානය |
| 25 | ආර්.එම්.සෙනෙවිරත්න මයා | ගරු සභාපති,සුචරිත ගොවි සංවිධානය |
| 26 | ආර්.ඩබ්.එම්.කුමාරසිංහ මයා | ගරු ලේකම්, සුචරිත ගොවි සංවිධානය |
| 27 | ආර්.එම්.ජයසේන මයා | ගරු සභාපති,දිලෙනතරු ගොවි සංවිධානය |
| 28 | සුමනසේකර මයා | සාමාජික, මහකැලේ |
| 29 | එන්.එම්.ගුණසේකර මයා | සාමාජික, මහකැලේ |
| 30 | කේ.එච්.ඩබ්.එම්.විජේපාල මයා | සාමාජික, මහකැලේ |
| 31 | යූ.කේ.ඩී.සෝමරත්න මයා | සාමාජික, බදුළුඔය |
| 32 | ඩී.එම්.පුංචිබංඩා මයා | සාමාජික,යු4/36, බදුළුඔය |
| 33 | ඩී.එම්.කරුණාරත්න මයා | සාමාජික, බදුළුඔය |
| 34 | එස්.එම්.සෝමපාල මයා | සාමාජික,වීර කැප්පෙටිපොල ගොවි සංවිධානය |
| 35 | එස්.එම්.කුමාර මයා | සාමාජික,වීර කැප්පෙටිපොල ගොවි සංවිධානය |
| 36 | ඩී.එම්.ගුණසිරි මයා | ගරු භාණ්ඩාගාරික,වීර උදාර ගොවි සංවිධානය |
| 37 | ආර්.එම්.පියදාස මයා | උප සභාපති, ගැමුණු ගොවි සංවිධානය |
| 38 | ඩබ්.එම්.මහින්දපාල මයා | ජල පාලක, බදුළුඔය |
| 39 | ආර්.ඩබ්.එම්.වීරසිංහ මයා | ගරු භාණ්ඩාගාරික,පැරකුම් ගොවි සංවිධානය |
| 40 | ආර්.එම්.සමරපාල මයා | සාමාජික, වීර කැප්පෙටිපොල ගොවි සංවිධානය |
| 41 | ඩී.එම්.ගුණපාල මයා | ජල පාලක, බදුළුඔය |
| 42 | බී.එම්.ශාන්තිලතා මිය | සාමාජික, ගජබා ගොවි සංවිධානය |
| 43 | ආර්.එම්.පොඩිමහත්තයා මයා | සාමාජික, ගැමුණු ගොවි සංවිධානය |
| 44 | ජේ.එම්.ගුණතිලක මයා | සාමාජික, ගැමුණු ගොවි සංවිධානය |
| 45 | ආර්.එම්.පියසිංහ මයා | සාමාජික, ගැමුණු ගොවි සංවිධානය |
| 46 | එම්.පී.ජේම්ස් මයා | සාමාජික, දිලෙනතරු ගොවි සංවිධානය |
| 47 | ජී.පී.ජේ.විමලසේන මයා | සාමාජික, ගැමුණු ගොවි සංවිධානය |
| 48 | ඩී.එම්.ධර්මදාස මයා | සාමාජික, ගැමුණු ගොවි සංවිධානය |
| 49 | ආර්.එම්.සෝමදාස මයා | සාමාජික, වීර කැප්පෙටිපොල ගොවි සංවිධානය |
| 50 | ඩී.එන්.ජයතිලක මයා | සාමාජික, ගැමුණු ගොවි සංවිධානය |
| 51 | ඩී.එම්.කරුණාරත්න මයා | සාමාජික, ගැමුණු ගොවි සංවිධානය |
| 52 | ඩී.එම්.පොඩිමහත්තයා මයා | සාමාජික, වීර කැප්පෙටිපොල ගොවි සංවිධානය |
| 53 | අබේරත්න මයා | සාමාජික, ගැමුණු ගොවි සංවිධානය |
| 54 | ඩබ්.එම්.රත්නපාල මයා | සාමාජික |

| | වග කිවයුතු නිළධාරියා |
|---|---|
| **පිළිගැනීම / ආගම සිහි කිරීම**<br>ආගම සිහි කිරීමෙන් අනතුරුව පැමිණ සිටි සියළුදෙනා පිළිගන්නා ලදි. පසුගිය වාර්තාව සමාලෝචනය කළ යුතුව තිබුණ ද කන්න රැස්වීම් වාර්තාව ලැබී නොතිබුණි. | නේවාසික ව<br>කළමණාක |
| මෙ දින වල පවතින අයහපත් කාලගුණ තත්වය නිසා 2019 යල කන්නය කන්න රැස්වීම තීරණය අනුව ක්‍රියාත්මක අපහසු වීමත්, එම කන්න රැස්වීම් තීරණ සංශෝධනය කර ඉදිරි කන්නය සැලසුම් කරගැනීම සඳහා අද දින විශේෂ ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීමට කටයුතු කළ බව කීය. | |

| | |
|---|---|
| කාලගුණ තත්වය එසේ පවතිද්දී ඉහළ ගොවි සංවිධාන (සුළු වාරිමාර්ග) අනිවාර්යෙන්ම වී වගාව සිදුකරන අතර එය නැවැත්විය නොහැකි බව දැන්විය.<br>දැනට ජලය තිබුණත් ඉහළ ගොවි සංවිධාන මේ දින වල ගොයම් කපන නිසා එම කටයුතු අවසන් වූ වහාම ඔවුන් ජලය ගත් විට ඝන අඩි 40ට ජල මට්ටම අඩු වන බවත්, ජලය ලබාදීමට නම් තත්පරයට ඝන අඩි 64ක් හෝ කිවුලෙගෙදර අමුණෙන් නිකුත් කළ යුතු බව කීය.<br>මේ වන විට බදුළුඔයේ ජලය අඩි 1 ½ ටත් වඩා අඩු නිසා Mini- Hydropower හරහා ජල විදුලිය නිෂ්පාදනය නොකරන ලෙසට දැනුම් දෙන බවත් කීය. | වාරිමාර්ග ඉංජිනේරු |
| අනවසර වගා කිරීම් නිසා සුළු ගොවි සංවිධාන වගා කටයුතු ප්‍රමාද කරන බවත්, ගොවිජන සංවර්ධන නිළධාරි හරහා අනිවර්යෙන්ම ඔවුන්ව මහා වාරිමාර්ග ජල මුර ක්‍රම වලට සම්බන්ධ කරගත යුතු යැයි යෝජනා කළේය. | ගරු සභාපති<br>සුවරිත ගොවි<br>සංවිධානය |
| පසුගිය කන්න වල මෙන්ම මෙවරත් ජල හිඟයක් පවතින නිසා වී වගාවෙන් තොරව අතිරේක බෝග වගාව පමණක්ම කිරීමට උපදෙස් ලබා දුනි.<br>නිරිත දිග මෝසම් සුළඟින් ද ඉතා අඩු වර්ෂාවක් ලැබෙන නිසා වගාව පිළිබඳ සැලකිලිමත් විය යුතු බව කීය.<br>සේනා දළඹුවාගේ ගැටළුවේදී මෙන්ම ජලය ද සීමිත නිසා යාය ම එකවර වගා කිරීම සුදුසු බව කීය.<br>සේනා දළඹුවාගේ ගැටළුවට අක්කරයට උගුල් දෙකක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ලබාදෙන බවත් ඒ සඳහා යොදන රසායනිකය රු.75 පමණ වන බවත් කිවෙය.<br>අතිරේක බෝග ලෙස රතු කව්පි, මුං ඇට වැනි බීජ ද ලබා දිය හැකි බවත් මතක් කළේය.<br>අප්‍රේල් 4 -10 දක්වා ගොවි සතියක් ලෙස හඳුන්වා එහිදී සේනා දළඹුවාගේ ගැටළුව ගැන විශේෂ දැනුවත් කිරීමක් කරන අතර ඒ සඳහා ගොවි සංවිධාන මට්ටමින් රැස්වීම පැවැත්වීමට දින ලබාදෙන ලෙස දැන්වීය. | තාක්ෂණික සහයක, කෘෂි<br>දෙපාර්තමේ |
| ගොවීන්ගේ අත්දැකීම්, නව තාක්ෂණය එකතු කරගෙන කටයුතු කිරීම වැදගත් බව කීය. | නේවාසික වා<br>කළමණාකරු |
| සුළු වාරිමාර්ග සමඟ සාකච්ඡා කර ජල ප්‍රශ්නය සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙන බව පැවසීය.<br>පොහොර සහනාධාරය හැකි ඉක්මනින් ලබාදෙන අතර එයට ගොවීන්ගේ සහය ද අත්‍යවශ්‍ය බව කීය. තවද, වැඩි මිල පොහොර රු. 1000 ට ලබාදීමේ ගැටළුව පිළිබඳ සාකච්ඡා කෙරෙමින් පවතින බවද පැවසීය.<br><br>03/20 සිට පහළට ජලය ලබාදීමට තිබුණත් 04/01 සිට ජලය දීමට කන්න රැස්වීමේ දී සාකච්ඡා කෙරුණු බව කීය.<br>සයිපනයේ දැනට පවතින ජල මට්ටම තිබුණොත් යන්තමින් හෝ වගා කටයුතු මුර ක්‍රමයකට කරගත හැකි බව පැවසීය. | සංවර්ධන නි<br>ගොවිජන සේ<br>මධ්‍යස්ථානය<br><br>ගරු සභාපති,<br>උදාර ගොවි<br>සංවිධානය |
| කන්න රැස්වීම් තීරණ වලට අනුව 04/01 අගාවත ගොවි සංවිධාන දෙකට ජලය ලැබුණු අතර, ඉන් උපරිම ප්‍රයෝජන ලබාගත් බව පැවසීය.<br>FC 73, FC 74, FC 75, FC 77, FC 85, FC 82 මේ වන විට වගා කටයුතු අවසන් බවත්, බදුළුඔයේ මේ වන විට යල කන්නයට මුහුණ දීමට තරම් ජල ප්‍රමාණයක් ඇති බව ද කීය. | ගරු සභාපති,<br>එක්සත් ගොවි<br>සංවිධානය |
| 20, 10 ඇලවල් වල බෝග යම් ප්‍රමාණයක් සිටුවා ඇති බව කීවෙය. 04/20 ට පෙර වර්ෂාව ලැබෙන තෙක් අමු ගොයම් වලට පැය 12 බැගින් හෝ එක් එක් ඇලට ජලය ලබා දෙමු යැයි කීවෙය. | සභාපති, පුබුදු<br>ගොවි සංවිධා |
| මාස් කන්නයේ බඩ ඉරිඟු වගා කර ඇති අතර ඒවායේ කිරි කරල් පවතින නිසා එම අක්කර 15ට පැය 12 කට හෝ ජලය අවශ්‍ය බව කීය. | ගරු සභාපති,<br>ගොවි සංවිධා |

| | |
|---|---|
| කන්න රැස්වීම් තීරණ පරිදි 03/20, 03/25 ට ජලය ලබාදීමට තිබුණු අතර 03/27 වන විට වුැක් 3ට හා දකුණු ඇලට දිය යුතු වුවත් 03/28 ජලය හිඟකම නිසා දකුණු ඇලට පමණක් ජලය ලබාගත් බව පැවසීය.<br>මේ වන විට ඇලේ ඉහළ මට්ටමක ජලය පවතින නිසා ජලය ලබාදෙන ලෙසට ඉල්ලීමක් කළේය. | ගරු සභාපති,<br>දිලෙනතරු<br>සංවිධානය |
| 03/20 ජලය ලබාදීමට තිබුණත් ජල ප්‍රමාණය අඩු නිසා දකුණු ඇලට දීමට තීරණය කළ බව සඳහන් කළේය.<br>මේ වන විට ඇලේ වතුර ඇති නිසා කන්න රැස්වීම් තීරණ අනුව 04/20 දින සිට 1, 2ට ජලය ලබාදෙන ලෙසට ඉල්ලීමක් කළේය.<br>ඉහළ ගොවීන්ට අප්‍රේල් 30 වන විට ජලය ලබාදීමට කටයුතු කරමු යැයි පැවසීය. | ගරු සභාපති,<br>සුචරිත ගොවි<br>සංවිධානය |
| අද සිට අගාවතට (3,4 ට) 04/20 දක්වා ජලය ලබාදෙන ලෙසට ඉල්ලීමක් කළේය. | ගරු සභාපති,<br>ගැමුණු ගොවි<br>සංවිධානය |
| වුැක් 3, වුැක් 4ට ජලය නවතා වුැක් 2ට ජලය ලබාදීම ගැන සතුටු වූ අතර 13, 16, 17 යන කොටස් වල අමු ගොයම් පවතින නිසා රාත්‍රී කාලයේ පැය දෙකක පමණ ජල මුරයක් ලබාදෙන ලෙසට ඉල්ලීමක් කළේය. | ගරු සභාපති,<br>පැරකුම් ගො<br>සංවිධානය |
| දකුණු ඇලේ අගාවත කොටසේ හැල්පත් කොටසක් පවතින නිසා එහි වී වගා කරන බව දැනුම් දුනි. | ගරු ලේකම්,<br>දිලෙනතරු<br>සංවිධානය |
| ජලය හිඟ නිසා අතිරේක බෝග පමණක් නිර්දේශ කරන අතර වෙනත් වගාවන් පිළිබඳ වගකීමක් නොගන්නා බව කීය.<br>තවද ජල මුර ක්‍රමය සකස් වන්නේ අතිරේක ආහාර බෝග වගා සඳහා පමණක් බවද වැඩිදුරටත් කීය. | වාරිමාර්ග<br>ඉංජිනේරු |
| පූස්ස යායේ විශේෂ ගැටළුවක් නොමැති බවත්, 80%ට වඩා අතිරේක බෝග වගා කරන බවත් කීය. | ගරු සභාපති,<br>ගොවි සංවිධා |
| ගල්ඔබ්බේ ප්‍රධාන අමුණේ කටයුතු සිදුකර දුන් නමුත් under caution වලින් ජලය අපතේ යන බවත්, අගුල් වලට ඉබි, යතුරු සෑදිය යුතු බවත් කීවේය.<br>Under caution වලට කොන්ක්‍රීට් දැමීමෙන් ද ජලය පිරිමසාගත හැකි බව කීය.<br>04/20 වන විට වගා කටයුතු අවසන් කළ හැකි බවත් කීවේය. | ගරු සභාපති,<br>කැප්පෙටිපො<br>ගොවි සංවිධා |
| යල කන්නයට 14න් පහළ වක්කඩයන් සමඟ ජලය ලබාදුන්නොත් අගාවතට ජලය යාම ගැටළුකාරී බව පැවසීය. | ගරු සභාපති,<br>ගැමුණු ගොවි<br>සංවිධානය |
| කොටසින් කොටස ජලය ලබා දිය හැකි බව පැවසුවේය. | තාක්ෂණික<br>සහයක,<br>බත්මැඩිල්ල |
| අගෝස්තු වන විට උමා ඔයෙන් ජලය හරවන බවට ආරංචි ලැබී ඇති අතර ඉන්පසු බත්මැඩිල්ලට ජලය ලැබෙන්නේ කෙසේද යන්න විමසීය.<br>තල්පිටිගල ජලාශයේ තත්වය ද විමසීය. | ගරු සභාපති,<br>සුචරිත ගොවි<br>සංවිධානය |
| තවම දැනුවත් කිරීමක් කර නැති අතර නිල වශයෙන් දැනගත් පසු වාර්තාවක් ලබාදෙන බව කීය.<br>මේ වන විට ජලාශයේ ඉදිකිරීම් ආරම්භ කර නොමැති අතර ප්‍රතිපාදන නිදහස් වූ වහාම ඉදිකිරීම් ආරම්භ වන බව සඳහන් කළේය. | වාරිමාර්ග<br>ඉංජිනේරු |
| සයිපනයේ සිට ඩී1 දක්වා ආනත පැත්තේ පාර දක්වාම බඩ ඉරිඟු වගාවන් සිදුකර ඇති නිසා නඩත්තු කම්කරුවන්ට වැඩ කිරීමේ දී අපහසුතා ඇතිවන බව දැන්වීය.<br>එමනිසා දැන්වීම් මගින් එම වගාවන් ඉවත් කිරීම පිළිබඳ දැනුවත් කරන අතර ඒ සඳහා ගොවි සංවිධාන වලින් සහයෝගය ලබාදෙන ලෙසට ඉල්ලීමක් කළේය. | ඉංජිනේරු ස<br>බදුළුඔය |

## සංශෝධිත වගා කාලසටහන - 2019 යල

### බත්මැඩිල්ල ව්‍යාපාරය

| අනු අංකය | කාර්යය | වම් ඉවුර යාය 3/4 FC14,මැද ඇල යාය 3/4 ,දකුණු ඉවුර, පුස්ස යාය | මැද ඇල යාය 1/2 වම් ඉවුර යාය 1/2 |
|---|---|---|---|
| 01 | වගා කරන බෝග වර්ගය | 50% වී හා 50% වෙනත් ආහාර බෝග වගාව | |
| 02 | වගා බිම් ප්‍රමාණය | අක්කර 1400 | |
| 03 | ඇල වේලි ශුද්ධ කර අවසන් කළ යුතු දිනය | 2019.03.25 | 2019.04.15 |
| 04 | පළමු ජල මුරය නිකුත් කිරීම | 2019.04.01 | 2019.04.20 |
| 05 | පැල සිටුවා හෝ වපුරා අවසන් කළ යුතු දිනය | 2019.04.20 | 2019.05.05 |
| 06 | අවසන් ජල මුරය නිකුත් කිරීම | 2019.07.20 | 2019.08.05 |
| 07 | අස්වනු නෙලා අවසන් යුතු දිනය | 2019.08.05 | 2019.08.20 |
| 08 | ගවයින් යායෙන් ඉවත් කළයුතු දිනය | 2019.04.20 | 2019.05.05 |
| 09 | රක්ෂණය කර අවසන් කළයුතු දිනය | 2019.04.20 | 2019.05.05 |
| 10 | වගා හානි දැනුම් දීමේ අවසන් දිනය | හානිය සිදු වී දින 14 ඇතුළත | |
| 11 | පොහොර සහනාධාරය ලබාදීම | පළමු ජල මුරය ලබාදීමත් සමග | |